## වැස්ස

හිරු මාමා සැඟව ගියා
අහසත් කළුපාට වුණා
වැහි මාමා සිනා සුනා
බිඳු බිඳු පොළවට වැටුණා

දැන් වැටෙන්නෙ පුංචි බිඳුයි
දැන් වැටෙන්නෙ මුතු පබළුයි
මේ වැටෙන්නෙ ගල් බොරළුයි
දැන් ගලන්නෙ දිය පහරයි

පුංචි පුංචි ගෙවල් තුළට
වතුර ගලනවා
පුංචි පුංචි සිදුරු තුළින්
වතුර වැටෙනවා
කුඩා කුඩා කරදහි ඔරු
රුවල් බඳිනවා
මෙහෙම වෙලා අන්තිමේදි
වැස්ස දුවනවා

පුංචි පුංචි කාණු දිගේ
වතුර බහිනවා
මහ පාරේ තිබ්බ වතුර
සිඳිලා යනවා
ගසුත් වැලුත් දළු ලියලා
එලබර වෙනවා
වැස්ස නිසා ගමම අළුත්
වී දිලිසෙනවා

♦ **සඳුනි නවෝදා**
**කුලසිංහ මහ විදුහල**
**උදම්මිට ජාඇල Sri Lanka**

## ගවමසින් වැළකෙමු!

පස්ගෝරස දිව පිනවයි
ගොම පොහොරින් පස සරුවෙයි
වගාවලට උදව් කරයි
ගවයා අප හැම රැකදෙයි

ගවමස් රසකර කන්නෝ
ලෙඩවීලා වැනසෙන්නෝ
මස්කෑමෙන් වැළකෙන්නෝ
දින දින දියුණට යන්නෝ

***එස්. එච්. ජේ. තිලංක***
*සිද්ධාර්ථ විද්‍යාලය - වැලිගම*




**Children's Corner**

## Which is the world's largest ocean ?
## ලොව විශාලතම සාගරය කොකද?

The Pacific occupies about a third of the Earth's surface and is by far the largest of the three oceans that extend northwards from Antartica. It has double the area and more than the double the water of the Atlantic. At 166 milllion square kilometeres, the Pacific's area exceeds that of the whole land surface of the globe. From North to South, it stretches for 15,000 kilometeres. It also contains the greatest known ocean deep, the Mariana Trench(11,034 metres).

පැසිෆික් ලොව විශාලම සාගරයයි. එය පෘතුවියෙන් තුනෙන් එකක ප්‍රමාණයක් පුරා පැතිරී ඇති අතර දක්ෂිණ ධ්‍රැවයෙන් විහිදෙන සාගර තුනෙන් ලොකුම එකය. අත්ලන්තික් සාගරය මෙන් ප්‍රමාණයෙන් හා ජලයෙන් දෙගුණයකි. වර්ග කිලෝ මීටර් මිලියන 166 ක් වන එය භූගෝලයේ මුළු බිම් ප්‍රමාණයට වඩා වැඩෑඩියග උතුරේ සිට දකුණට දිග කි. මී. 15000 කි. මරියා-නා අගල නමින් හඳුන් වන මුහුදේ ඉතාම ගැඹුරු තැන ද ඇත්තේ පැසිපික් සාගරයේය.

♦ ***Auntie Ramani ( රමනි නැන්දා )***

## පරිසරය සුන්දරයි



මල් පිපිලා සුවඳ හමයි
බමර ගීත දසත ඇසෙයි
ගස් වැල් එලබරින් නැමයි
සියොතුන් සතුටින් ඉපිලෙයි

ගසක් නිසා සෙවන රැදේ
ඒ හින්දා සිසිල සැදේ
සිසිල නිසා සුවය සැදේ
රටටම ඉන් සතුට බෙදේ

පොළව මත තෙතමනය රැඳිලා
උල්පතින් දිය උඩට ඇදිලා
එයින් හැමගේ පවස නිවලා
දියබිඳෙන් මහ ගහක් හැදිලා

**රශ්මි ප්‍රතිභා නාමරත්න**
පොතුවිල මහා විද්‍යාලය - පයාගල **Sri Lanka**

**ලංකා බැංකුව**
**BANK OF CEYLON**

ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

***ලන්ඩන් ශාඛාව***

***ඔබේ මුදල් ගාස්තුවකින් තොරව සුරක්ෂිතව හා විශ්වාසදායකව ශ්‍රීලංකාවට ප්‍රේෂණයකිරීමේ මහඟු අවස්ථාවක් !***

* ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාව මගින් ශ්‍රීලංකාවේ ලංකා බැංකු ශාඛාවන්හි පවත්වාගෙන යනු ලබන ඕනෑම ගිණුමකට ඔබත් ගාස්තුවකින් තොරව මුදල් ප්‍රේෂණය කරන්න.

* ඔබගේ ඉතුරුම් වෙනුවෙන් ලංකා බැංකුවේ අනේවාසික විදේශ ගිණුමක් (NRFC) ආරම්භකර පවුම් වලින් මුදල් ප්‍රේෂණය කර පහත සඳහන් ප්‍රතිලාභ ලබාගන්න.

1. පවුම් වලින්ම පොළිය ලබාගැනීම.
2. ගිණුමේ ඇති මුදල් නිදහසේ ඕනෑම අයෙකුට හෝ විදේශ රටක ඇති ගිණුමකට ප්‍රේෂණය කිරීමේ හැකියාව.
3. NRFC ගිණුම මාර්ගයෙන් මුදල් ප්‍රේෂණය කිරීමෙන් උපරිම විනිමය අනුපාතිකයක් රුපියල් සඳහා ලබාගැනීමේ හැකියාව.

*ලංකා බැංකුවට පැමිණීමෙන් හෝ* HSBC, NATWEST, BARCLAYS *බැංකු වලින් අපගේ පහත සඳහන් රැස්කිරීමේ ගිණුම්වලට මුදල් බැර කිරීමෙන් අනතුරුව අපව අමතන්න.*

HSBC - Sort Code : 40 - 05 - 15 A/C - 00491624
NatWest - Sort Code : 60 - 00 - 04 A/C - 04607732
BARCLAYS - Sort Code : 20 - 32 - 53 A/C - 80113859

**No 1, Devonshire Square, London EC2M 4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
e-mail : bankofceylon.uk@btclick.com
Our Web - www.boc.lk
Nearest railway station - Liverpool Street (tube & rail) Bishop Gate Exit

## තෙවර්ෂ පූර්ණ සිහිකිරීමයි
## සුනීතා කීර්තිචන්ද්‍ර මහත්මිය



ආදරණීය ඔබ අපඅතරින් වියෝවී වසර තුනක් සම්පූර්ණ වෙයි. ඒ වෙනුවෙන් සාංඝික දානයක් දී ඔබ සිහිකරන්නෙමු. මතු සසරේ අකල් මරණයක් නොවේවායි පතමු!
ඔබට උතුම් නිවන් සුව අත්වේවා!

අදරැති ගාමිණී, දියණියන්, පුතා සහ ලන්ඩනයේ හිතවතුන් සැම




**බහු සංස්කෘතික නැටුම් සංදර්ශණයක්**
ලෙච්වර්ත් හි ප්ලින්ස්ටන් ශාලාවේදී
***2010 නොවැම්බර් 27 දා හවස 7 ට***
**වැඩි විස්තර සඳහා www.pragathicafe.com**
**Phone 01462 686075**

## සාදර සිහිකිරීමයි!



## නීතිඥ පරාක්‍රම රණසිංහ මහතා

අභාවප්‍රාප්තව ගිය ඔක්තෝබර් **21** වෙනි දිනට වසර **8** ක් පිරුණි. මේ සියළු කල්හි ඔබ ගතින් අප අතර නැති නමුදු අප සිතින් ඔබ ඈත්ව ගියේ නැත.

ඔබ සිහිපත්කර ලන්ඩනයේ කිංස්බරි විහාරයේදී සංඝගත දක්ෂිණාවක් පිරිනැමිණ. එපින් බෙලෙන් මතු ඔබට අකල් මරණයක් නොවේවායි පතමු! ඔබට නිවන් සුව අත්වේවා !

ආදරණීය බිරිඳ මානෙල්, දරුවන් හා ලන්ඩනයේ හිතෛෂීන් පිරිස.

***Srilanka Information Sites ශ්‍රී ලංකා තොරතුරු අඩවි***
**www.srilankans.com www.srilankatours.co.uk www.srilanka-holidays.co.uk**